*සැ. යු.*- මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2009 වර්ෂයේ අප්‍රේල් - ජුනි කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,775 - 2012 සැප්තැම්බර් මස 07 වැනි සිකුරාදා - 2012.09.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1296 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1298 |


*සැ. යු.*- රණවිරු සේවා අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත 2012 ජූලි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

බරීරා මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අගෝස්තු මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 සැප්තැම්බර් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 සැප්තැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*)

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1293 - B 80644 —8880 (2012/09)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ඉල්ලුම් කළ හැකි ය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ඔක්තෝබර් මස 07 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අගෝස්තු මස 09 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මාතලේ | මාතලේ | මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ නගර කොට්ඨාසයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

09-10

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ඔක්තෝබර් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අගෝස්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ කන්දෙවත්ත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

09-09

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ඔක්තෝබර් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අගෝස්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | සම්මන්තුරේ | මජීඩ්පුරම් ග්‍රාමය කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |

09-08

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ඉල්ලුම් කළ හැකි ය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 ඔක්තෝබර් මස 08 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 අගෝස්තු මස 21 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | මාවනැල්ල | මැද පත්තුව කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ ගල්බඩ කෝරළයේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

09-173

## සංශෝධනයයි

### වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ වෙළඳ නාවික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ තනතුරුවලට බඳවා ගැනීමේ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය සංශෝධනය කිරීම

තනතුරු :-

1. විභාග පරීක්ෂක (ඉංජිනේරු)
2. වරාය රාජ්‍ය පාලන නිලධාරි (ඉංජිනේරු)
3. වරාය රාජ්‍ය පාලන නිලධාරි (නැව් තට්ටු)
4. රාජ්‍ය නෞකා සමීක්ෂක

අංක 1,771 හා 2012.08.10 දිනැති *ගැසට් පත්‍රයේ* පළ වූ ඉහත තනතුරුවලට අදාළ බඳවාගැනීම් සඳහා වන අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2012.09.12 වැනි දින දක්වා දීර්ඝ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

02. ඉහත *ගැසට් නිවේදනයේ* පළ වූ අනෙකුත් තොරතුරු නොවෙනස්ව පවතින බව සලකන්න.

ලේකම්,
වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය.

09-249

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක තනතුරු සඳහා) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

### Open Competitive Examination for Recruitment of Meteorological Observers/Communicators to the Training Grade of the Sri Lanka Technological Service - 2012

01. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණියේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/කාලගුණ විද්‍යා සන්නිවේදක තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත්, ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගය පදනම් කරගෙන සුදුසු අය තෝරාගනු ලැබේ.

03. මෙම තරග විභාගය විභාග දෙපාර්තමේන්තුව විසින් 2012 නොවැම්බර් මාසය තුළ උපලේඛන අංක 01හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි දී සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ඉල්ලා ඇති අපේක්ෂක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව පෙනී ගියහොත් එම මධ්‍යස්ථානය අවලංගු කොට එකී අපේක්ෂකයන් ආසන්න මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත.

විභාගය පැවැත්වෙන විභාග මධ්‍යස්ථානයන් හා විභාග මධ්‍යස්ථාන අංක උපලේඛනය අංක 01හි දක්වා ඇත. ඉල්ලුම් පත්‍රයේ අදාළ ශීර්ෂයේ මෙම විභාග මධ්‍යස්ථානයන් හා විභාග මධ්‍යස්ථාන අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතු ය. *ගැසට් නිවේදනය* අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර 2ක් කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න. ඉල්ලුම් කරන මාධ්‍යය හා විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වෙන් කරන අතර එම තනතුරු රජයේ *ගැසට් නිවේදනයෙන්* හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා විවෘත තරග විභාගයක් පවත්වනු ලැබේ. විභාගයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීම් කෙරේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදේ.) අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේ දී විෂයයන් දෙකෙන්ම උපරිම ලකුණු ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හා ඊට සම්බන්ධව නිකුත් කරනු ලැබිය හැකි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම කරනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

05.1 බාහිර අයදුම්කරුවන් සඳහා :

පහත සඳහන් ආකාරයට විෂයයන් 03කින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම

(අ) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය;

හෝ

(ආ) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය හෝ සංයුක්ත ගණිතය සහ පහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයක්
රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂිකර්මය; සහ

භාෂාව හෝ සාහිත්‍යයත්, ගණිතයත්, විද්‍යාවත් සහ තවත් එක් විෂයයකටත් සම්මාන සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා/පෙළ.) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම.

05.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට වැඩි නොවිය යුතු ය. (දැනටමත් රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලනොපානු ඇත.).

05.3 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

05.4 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

05.5 සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

*ඉල්ලුම් කළ යුතු පිළිවෙල* :

06. මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියේ එක් පැත්තක් ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 04 (ඉ) තෙක් මුල් පිටුවට ඇතුළත් වන පරිදි සකස් කරගත් ඉල්ලුම් පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතු ය. නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත් 2012.10.05 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක තනතුරු යන්න සඳහන් කළ යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලුම්පත් එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන හෝ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

07. විභාග ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් එවනු ඇත. විභාග අපේක්ෂකයන් විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශපත්‍ර ඉදිරිපත් නොකරනු ලබන කිසිම අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයදුම් පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සහිතව ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු යි. එම ලිපියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. ලිඛිත විභාගයේ දී අනන්‍යතාවය සහතික කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

09. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්හට තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාග සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේ දී ඉහළම කුසලතාවක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබාදීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

10. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතු ය.

11. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු රුපියල් 2,37,060 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

12. *විභාග ගාස්තු* :
විභාග ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 500 ක මුදලක් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් නමට ලංකා බැංකුවේ ටොරින්ටන් චතුරස්‍රය ශාඛාවේ ගිණුම් අංක 7042678 යන ගිණුමට බැරකර ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් ලදුපත නොගැලවෙන සේ අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*ලිඛිත විභාගය* :

මෙම තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය. ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. :

(1) බුද්ධි පරීක්ෂණය,
(2) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය.

14. *විෂය නිර්දේශය* :

(1) *බුද්ධි පරීක්ෂණය* : කාලය පැය 01කි. මුළු ලකුණු 100 යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවත්, ඔහුගේ විශ්ලේෂණ හැකියාවත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්න වලින් යුක්ත ය.

(2) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය* : කාලය පැය 02කි. මුළු ලකුණු 100යි. භෞතික විද්‍යාව විෂයය ආශ්‍රිත අ. පො. ස. (උ/පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ දැනුම නිශ්චය කෙරේ.

15. *තේරීම් පරිපාටිය* :

(1) සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයකින් ලකුණු 40%ක් හෝ ඊට වඩා ලබාගත යුතු ය. එසේ ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් අතරින් වැඩිම ලකුණු ප්‍රමාණය ලත්

අපේක්ෂකයින්, සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නො ලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේ දී විෂයයන් දෙකෙන්ම උපරිම ලකුණු ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් පුහුණු කිරීමේ ශ්‍රේණියට පත්කරනු ලැබේ.

16. *වෛද්‍ය පරීක්ෂණය.*-තෝරාගත් අයදුම්කරුවන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික යෝග්‍යතාවයකින් හෙබිබව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් නුසුදුස්සන් වනු ඇත.

17. *වැටුප් ක්‍රමය :*
(අංක 6/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනවලට අනුව)
6/2006 (II) පරිදි පුහුණු කිරීමේ ශ්‍රේණිය :
1 වසර සඳහා රු. 12,920.00
2 වසර සඳහා රු. 13,040.00

අංක 6/2006 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" ඛණ්ඩයට, II පන්තියේ "අ" ඛණ්ඩයට, I ශ්‍රේණි සඳහා MN 3 - 2006 - A - වැටුප් පරිමාණය අදාල වේ.

රු. 15,005 - 4 x 180 - 6 x 240-11 x 320-20 x 360 - රු. 27,885 (මාසික)

*සටහන.*—පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවාගනු ලබන අයදුම්කරුවන් දෙවසරක පුහුණුව අවසානයේ පෙනී සිටිය යුතු යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ විට II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයට බඳවා ගනී.

18. *සේවා කොන්දේසි :*

18.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වසර 02ක පුහුණු කාලසීමාවෙන් අනතුරුව පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වන අතර තෝරාගනු ලබන අය වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

18.2 තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාව, ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රෙගුලාසි හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද යටත් විය යුතු ය.

18.3 රාජ්‍ය භාෂා නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියෙකු පත් කළ දින සිට අවුරුදු 03ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීම ඊළඟ වැටුප් වර්ධකය විලම්භනය වීමට හේතු වනු ඇත.

18.4 ස්ථිර පත්වීමේ දින සිට වසර 05ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007හි දැක්වෙන පරිදි තම තනතුරට අදාළ වන මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු වේ. අදාළ කාලය තුළ එම ප්‍රවීණතාවය ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාවය ලබාගන්නා තුරු වැටුප් වර්ධක නතර කෙරේ.

18.5 1,589/30 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටි රීතිවල සඳහන් බඳවා ගැනීම සඳහා වූ කොන්දේසි අදාළ වේ.

18.6 *විශේෂ :-*

(i) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් රාජකාරි භාර ගැනීමට පෙර අවුරුදු 07ක අවම සේවා කාලයක් සේවා කරන බවට ද ඔහු/ඇය එම කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් රු. 2,50,000 ක වලංගු මුදලක් හා ඒ දක්වා නිලධාරියා වෙනුවෙන් රජය මගින් වැය කරන ලද වැටුප් දීමනා ඇතුළු සියලු වියහියදම් ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවට ද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පිළිගන්නා වූ ඇපකරුවන් දෙදෙනෙක් ද සහිතව බැඳුම්කරයක් ලියා අත්සන් කළ යුතු ය.

(ii) රාජකාරි වේලාවන් සෑම විටම සාමාන්‍ය කාර්යාල වේලාවන් නොවන අතර දිවා රාත්‍රි දෙකෙහිම සහ සෙනසුරාදා සහ ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන්හි ද යෙදෙනු ඇත. කෘත්‍ය ලේඛන අනුව ද රාජකාරි කිරීමට සිදු වේ.

(iii) ඔවුන් දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කළයුතු වේ.

එස්. එච්. කාරියවසම්,
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2012 අගෝස්තු මස 17 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**උපලේඛනය 01**

***විභාගය පවත්වන මධ්‍යස්ථාන හා මධ්‍යස්ථාන අංක***

| *මධ්‍යස්ථානය* | *මධ්‍යස්ථාන අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| නුවර | 02 |
| ගාල්ල | 03 |
| කුරුණෑගල | 04 |
| අනුරාධපුරය | 05 |
| රත්නපුර | 06 |
| බදුල්ල | 07 |
| යාපනය | 08 |
| වවුනියාව | 09 |
| මඩකලපුව | 10 |

***ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක තනතුරු සඳහා) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012***

OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT OF METEOROLOGICAL OBSERVERS/COMMUNICATORS TO THE TRANING GRADE OF THE SRI LANKA TECHNOLOGICAL SERVICE - 2012

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (කොටුව තුළ අදාළ අංකය යොදන්න) ☐ සිංහල - 2 දෙමළ - 3 ඉංග්‍රීසි - 4

* විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය හා මධ්‍යස්ථාන අංකය

| *විභාග මධ්‍යස්ථානය* | *මධ්‍යස්ථාන අංකය* | |
|---|---|---|
| | | |
| | | |

(*ගැසට් නිවේදනයේ උපලේඛන අංක 01 අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න*)

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන් :- *උදා* : (SILVA A. B. C.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (සිංහලෙන්/ දෙමළෙන්) :————. මහතා/ මෙනෙවිය/ මහත්මිය.

(ඇ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————. (සිංහලෙන්/ දෙමළෙන්)

(ඈ) මුලකුරුවලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. ස්ත්‍රී/පුරුෂ භාවය :- පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐
(කොටුව තුළ අදාළ අංකය යොදන්න.)

04. ස්ථිර ලිපිනය :
(අ) (සිංහලෙන්/ දෙමළෙන්) :

(ආ) ඉංග්‍රීසියෙන් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ඇත.)

(ඇ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ඉ) ඔබගේ දුරකතන අංකය :————.

05. (අ) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) 2012.10.05 වන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

06. විවාහක/අවිවාහක බව : ☐ විවාහක - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අවිවාහක - 2

07. ජනවර්ගය : ☐
සිංහල - 1, ද්‍රවිඩ - 2, වෙනත් - 3, (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

08. අධ්‍යාපන සුදුසුකම් :
(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

*පළමුවන වර* *දෙවන වර*

*වර්ෂය* :————. *වර්ෂය* :————.

*විභාග අංකය* :————. *විභාග අංකය* :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ. පො. ස. (උ.පෙළ) විභාගය :

*වර්ෂය* :————. *විභාග අංකය* :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම්/තාක්ෂණික සුදුසුකම් :
9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :————.
9.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :————.
9.3 අදාළ උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :————.

10. වෙනත් සුදුසුකම් :————.

11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද ? ඔව්/නැත

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය. :————.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයකු නම් එසේ ඉවත්වීමට හේතුව :————.

14. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :
 14.1 විභාග ගාස්තු ගෙවූ බැංකුවේ නම ........................
 14.2 රිසිට්පත් අංකය :————.
 14.3 මුදල් ගෙවූ දිනය :————.

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ අමුණන්න.<br>ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න. |

15. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීම හා විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි. මෙම විභාගයේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි. තවද මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් ගනු ලබන තීරණවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය ........................ වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

————,
අයදුම්කරුගේ ආදර්ශ අත්සන

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.
ලිපිනය :————.

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කල යුතුය.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත තොරතුරු සඳහන් .......................... මහතා/ මහත්මිය/ මෙනවිය ................. කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය දින සිට ................. තනතුරක සේවය කරන බව ද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද මෙම විභාගයේ ප්‍රතිඵල මත පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බව ද/නොකරන බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(මෙය දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට පමණක් අදාළ වේ.)

09-33/1

---

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" බණ්ඩයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012

### OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO THE POST OF TELE COMMUNICATION AND RADAR TECHNICIANS OF THE SRI LANKA TECHNOLOGICAL SERVICE (CLASS II (B)) - 2012

01. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයකින් සුදුසුකම් ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් අතුරෙන් කුසලතා පදනම් කරගෙන සුදුසු අය තෝරා ගනු ලැබේ.

03. මෙම තරග විභාගය 2012 නොවැම්බර් මාසය තුළ කොළඹ මධ්‍යස්ථානයක දී විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

04. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වෙන් කරන අතර එම තනතුරු රජයේ ගැසට් නිවේදනයෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා විවෘත තරග විභාගයක් පවත්වනු ලැබේ. ඉන් දක්වන කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව රාජ්‍ය පරිපාලන

චක්‍රලේඛ 15/90 හා ඊට සම්බන්ධව නිකුත් කරනු ලැබිය හැකි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" ඛණ්ඩයට බඳවා ගැනීම කරනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

05.1 (අ) මූලික අධ්‍යාපන සුදුසුකම් වශයෙන් පහත සඳහන් ආකාරයට විෂයයන් 03කි අ. පො. ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම.

(i) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය *හෝ;*

(ii) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය හෝ සංයුක්ත ගණිතය සහ පහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයක් :
රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිත විද්‍යාව, ජීව විද්‍යාව;

*සහ*

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (ස. පෙළ) විභාගයට දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

(ආ) බඳවා ගැනීමේ ශ්‍රේණිය වන II පන්තිය 'ආ' ඛණ්ඩයට ඇතුළත් කර ගැනීම සඳහා ඉහත (අ) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබාගත යුතුය.—

(i) මොරටුව විශ්ව විද්‍යාලය සහ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව);

හෝ

(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව);

හෝ

(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව);

හෝ

(iv) විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව);

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු කොටස සමත්වීමේ සහතිකය (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව);

හෝ

(vi) ඉහත තාක්ෂණික සුදුසුකම් වලට සමාන යයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

05.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට වැඩි නොවිය යුතුය.

05.3 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

05.4 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

05.5 සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාල සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල :*

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියේ එක් පැත්තක් ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 04 දක්වා මුල් පිටුවට ඇතුලත් වන පරිදි සකස් කරගත් ඉල්ලුම් පත්‍රය තම අත් අකුරෙන්ම පිරවිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කල අයදුම්පත් 2012.10.05 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07" යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි තනතුර"යන්න සඳහන් කල යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

07. විභාග ප්‍රවේශ පත්‍රය, විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයන් වෙත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් එවනු ඇත. විභාග අපේක්ෂකයන් විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරනු ලබන කිසිම අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයදුම් පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කල ඡායා පිටපත්ද ලියාපදිංචි තැපැල් කුවිතාන්සියද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සහිතව ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුයි. එම ලිපියේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. ලිඛිත විභාගයේදී අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ තැපැල්පති විසින් නිකුත් කල වලංගු තැපැල් හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

09. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්හට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාග සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවටවූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේදී ඉහළම කුසලතාවක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබාදීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

10. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය කාලගුණ විද්‍යා අධ්‍යක්‍ෂ ජනරාල් සතු ය.

11. අයදුම්පතේ අපේක්‍ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, රුපියල් 2,37,060 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12. *විභාග ගාස්තු :*
විභාග ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 500 ක මුදලක් කාලගුණ විද්‍යා අධ්‍යක්‍ෂ ජනරාල් නමට ලංකා බැංකුවේ ටොරින්ටන් චතුරස්‍රය ශාඛාවේ ගිණුම් අංක 7042678 යන ගිණුමට බැරකර ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් ලදුපත නොගැලවෙන සේ අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. *ලිඛිත විභාගය :*

මෙම තරග විභාගය විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්‍ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(1) බුද්ධි පරීක්‍ෂණය,
(2) තාක්‍ෂණ ප්‍රශ්න පත්‍රය.

14. *විෂය නිර්දේශය :*

(1) *බුද්ධි පරීක්‍ෂණය :* කාලය පැය 01කි. මුළු ලකුණු 100 යි. අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ විශ්ලේෂණ තත්වය තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය.

(2) *තාක්‍ෂණ ප්‍රශ්න පත්‍රය :* කාලය පැය 02කි. මුළු ලකුණු 100යි. භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික් විද්‍යාව පිළිබඳව අපේක්‍ෂකයාගේ දැනුම විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්න වලින් යුක්තය.
භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විෂයයන්ට අදාළව අ. පො. ස. (උ.පෙළ) විභාග මට්ටම, විද්‍යුත් මූලධර්ම, අර්ධ සන්නායක, ඩිජිටල් තාක්‍ෂණය, විවිධ සන්නිවේදන, සහ දත්ත හුවමාරු ක්‍රම පිළිබඳව හා ඩිප්ලෝමා මට්ටම දක්වා වූ ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ පිළිබඳ අපේක්‍ෂකයාගේ දැනුම විනිශ්චය කෙරේ.

15. තේරීම් පරිපාටිය :

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයකින් ලකුණු 40%ක් හෝ ඊට වඩා ලබාගත යුතුය. එසේ ලකුණු ලබා ගන්නා අපේක්‍ෂකයින් අතරින් වැඩිම ලකුණු ප්‍රමාණය ලත් අපේක්‍ෂකයින්, සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්‍ෂා කර බලනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. ඉහත 05 යටතේ ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේදී විෂයයන් දෙකෙන්ම උපරිම ලකුණු ගත් අපේක්‍ෂකයින් තෝරා ඔවුන් ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II පන්තියේ "ආ" බණ්ඩයට පත්කරනු ලැබේ.

16. *වෛද්‍ය පරීක්‍ෂණය.*-තෝරාගත් අයදුම්කරුවන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික යෝග්‍යතාවයකින් හෙබිබව සනාථ කරනුවස් වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු අතර වෛද්‍ය පරීක්‍ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අපේක්‍ෂකයින් නුසුදුස්සන් වනු ඇත.

17. *වැටුප් ක්‍රමය :*
(අංක 6/2006 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN- 3 - 2006 A අනුව)

රු. 15,005 - 4 x 180 - 6 x 240-11 x 320-20 x 360 - රු. 27,885 (මාසික)
(රු. 15545 වැටුපට එළඹීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉමක් සහිතය.)

18. *සේවා කොන්දේසි :*

18.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වන අතර තෝරාගනු ලබන අය වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

18.2 තෝරාගනු ලබන්නන් ආයතන සංග්‍රහයේ විධිවිධාන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාව සම්බන්ධව කලින් කල කරනු ලබන සංශෝධනවලටද යටත් විය යුතුය.

18.3 රාජ්‍ය භාෂා නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියෙකු පත් කළ දින සිට අවුරුදු 03ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා පරීක්‍ෂණයෙන් සමත්විය යුතුය. නියමිත කාලය තුළ මෙම පරීක්‍ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වර්ධකය විලම්භනය වීමට හේතු වනු ඇත.

18.4 ස්ථිර පත්වීම් දින සිට වසර 05ක් ඇතුලත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007හි දැක්වෙන පරිදි තම තනතුරට අදාල වන මට්ටමේ දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය ලබාගත යුතුවේ. අදාල කාලය තුළ එම ප්‍රවීනතාවය ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීනතාවය ලබාගන්නා තුරු වැටුප් වර්ධක විලම්භනය වේ.

18.5 රාජ්‍ය කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති 1589/30හි පත් කිරීම් බඳවා ගැනීම සම්බන්ධයෙන් සියලු විධිවිධානද ඇතුලත් වේ.

*විශේෂ :-*

(i) රාජකාරි වේලාවල් සෑම විටම සාමාන්‍ය වැඩ කරන වේලාවල් නොවන අතර දිවා රාත්‍රි දෙකෙහිම සහ සෙනසුරාදා, ඉරිදා

සහ රජයේ නිවාඩු දිනයන්හි ද රාජකාරි අවශ්‍යතාවය මතද වන අතර කෘත්‍ය ලේඛන අනුව ද රාජකාරි කිරීමට සිදු වේ.

(ii) පත්වීම්ලාභීන් දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා බැඳී සිටිය යුතුවේ.

එස්. එච්. කාරියවසම්,
කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්,

2012 අගෝස්තු මස 28 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ (ආ) කාණ්ඩයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2012**

Open Competitive Examination for Recruitment to the Post of Tele Communication and Radar Officer of the Sri Lanka Technological Service (Class II (B)) - 2012

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (කොටුව තුළ අදාල අංකය යොදන්න) ☐ සිංහල - 2 දෙමළ - 3 ඉංග්‍රීසි - 4

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන් :
උදා : (SILVA A. B. C.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම(සිංහලෙන් /දෙමළෙන්) :————. මහතා/මෙනෙවිය/මහත්මිය

(ඇ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————. (සිංහලෙන්/ දෙමළෙන්)

(ඈ) මුලකුරු වලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

02. ජාතික හැඳුනුම්පත් අංකය

03. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐
(කොටුව තුළ අදාල අංකය යොදන්න.)

04. ස්ථිර ලිපිනය :
(අ) (සිංහලෙන්/ දෙමළෙන්) :

(ආ) ඉංග්‍රීසියෙන් :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ඇත.)

(ඇ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(ඉ) ඔබගේ දුරකතන අංකය :————.

05. (අ) උපන්දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) 2012.10.05 වන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

06. විවාහක/අවිවාහක බව : ☐ විවාහක - 1 අවිවාහක - 2
(අදාල අංක කොටුව තුළ ලියන්න)

07. ජනවර්ගය ☐

සිංහල - 1, ද්‍රවිඩ - 2, වෙනත් - 3, (අදාල අංකය කොටුව තුළ ලියන්න.)

08. අධ්‍යාපන සුදුසුකම් :
(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගය

*පළමුවන වර* — *දෙවන වර*

*වර්ෂය* :————. *වර්ෂය* :————.

*විභාග අංකය* :————. *විභාග අංකය* :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ. පො. ස. (උ.පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තිය සුදුසුකම්/තාක්‍ෂණික සුදුසුකම් :
9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :————.
9.2 අදාල උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :————.
9.3 අදාල උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :————.

10. වෙනත් සුදුසුකම් :————.

11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද ? ඔව්/නැත

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය. :————.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත්වී සිටින අයකු නම් එසේ ඉවත්වීමට හේතුව :————.

14. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු;
14.1 විභාග ගාස්තු ගෙවූ බැංකුවේ නම :————.

14.2 රිසිට්පත් අංකය :————.

14.3 මුදල් ගෙවූ දිනය :————.

මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ අමුණන්න
ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.

15. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි. මෙම විභාගයේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් අපේක්‍ෂකත්වය අවලංගු කිරීමට හෝ පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි. තවද මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් ගනු ලබන තීරණ වලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................... මහතා මහත්මිය මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය ........................ වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ ආදර්ශ අත්සන

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත තොරතුරු සඳහන් ........................ මහතා/මහත්මිය/මෙනවිය .................. කාර්යාලයේ සේවය කරන බවද ඔහු/ඇය ............ දින සිට .................. තනතුරක සේවය කරන බවද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවද මෙම විභාගයේ ප්‍රතිඵල මත පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බවද/නොකරන බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(මෙය දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට පමණක් අදාලවේ.)

09-33/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.* - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2012**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 2012.09.07 | සිකුරාදා | 2012.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.14 | සිකුරාදා | 2012.08.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.09.21 | සිකුරාදා | 2012.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.09.28 | සිකුරාදා | 2012.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2012.10.05 | සිකුරාදා | 2012.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.12 | සිකුරාදා | 2012.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.19 | සිකුරාදා | 2012.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.10.25 | බ්‍රහස්පතින්දා | 2012.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2012.11.02 | සිකුරාදා | 2012.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.09 | සිකුරාදා | 2012.10.25 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.11.16 | සිකුරාදා | 2012.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.23 | සිකුරාදා | 2012.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.11.30 | සිකුරාදා | 2012.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.)

2012 ජුනි මස 23 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.